රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**<u>ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම</u>**

සුරාබදු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින සුරාබදු කොමසාරිස් තනතුරේ පුරප්පාඩු දෙක (02) සඳහා සුදුසුකම්ලත් සියළුම නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1.** වැටුප් ක්‍රමය :

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධි විධානයන්ට අනුව SL-1-2016 වැටුප් පරිමාණය එනම්, 47,615 – 1,335 X 10 – 1,630 X 8 – 2,170 X 17 – 110,895/= (මාසික) මෙම තනතුරට හිමිවන අතර එහි 20 වන පියවර මෙම තනතුරේ ආරම්භක වැටුප් පියවර වේ.

2. **වයස් සීමාව:** අදාළ නොවේ.

3. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්

3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

3.1.1. සපුරාලිය යුතු සුදුසුකම්

3.1.1.1. නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරේ අවම වශයෙන් වසර පහක (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම

3.1.1.2. නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

3.1.1.3. නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරෙහි ස්ථිර කර තිබීම.

3.1.1.4. පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

3.1.1.5. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර 05 තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

4.  උසස් කිරීමේ ක්‍රමය:

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් දෙපාර්තමේන්තුගත අභ්‍යන්තර දැන්වීමක් සහ වෙබ් අඩවියේ දැන්වීමක් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවා ඉහත 3.1 හි සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පහත සඳහන් ලකුණු පරිපාටිය යටතේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට ලක්කර එහිදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිලෙින් පවත්නා පුරප්පාඩුවලට සුදුස්සන් තෝරා ගනු ලැබේ.

| ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ | එක් එක් ශීර්ෂය යටතේ ලබාදෙන උපරිම ලකුණු | මුළු ලකුණු |
|---|---|---|
| 1. සේවා පලපුරුද්ද සඳහා:<br>නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරට පත් වී වසර 05 ට පසු එක් වසරකට ලකුණු 05 බැගින් | 60 | 60 |
| 2. කුසලතාවය සඳහා:<br>අ) කාර්ය සාධනය සඳහා ලකුණු (පූර්වාසන්න වසර 05 සඳහා)<br>I. විශිෂ්ය ලකුණු 04<br>II. සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ ලකුණු 03<br>III. සතුටුදායක ලකුණු 02 | 20 | 35 |
| ආ) උසස් අධ්‍යාපන සුදුසුකම්<br>I. පශ්චාත් උපාධි සඳහා ලකුණු 10<br>II. පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා ලකුණු 05 | 10 | |
| ඇ) වෘත්තීය පුහුණු/ විශේෂ පුහුණු | 05 | |
| 3. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම :<br>• පෞරුෂත්වය ලකුණු 02<br>• සන්නිවේදන හැකියාව ලකුණු 02<br>• නායකත්වය ලකුණු 01 | 05 | 05 |
| | | 100 |

5.  සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

මෙම තනතුරේ පත්වීම ක්‍රියාත්මක වන දිනය සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අවසාන දිනය වේ.

6. සේවා කොන්දේසි:

I. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට නියම කරනු ලැබිය හැකිය.

II. සුදුසුකම් ඇති තම තනතුරේ ස්ථිර කරනු ලැබුවා වූ නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරුන් තමාගේ අයදුම්පත් මීට අමුණා ඇති ආදර්ශ ආකෘතිය මගින් 2020.10.20........... දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත දක්වා ඇති ලිපිනයට ඉදිරිපත් කළ යුතු ය.

III. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සුරාබදු කොමසාරිස් තනතුර" යන්න සටහන් කළ යුතු ය.

සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,
අංක 353,
කෝට්ටේ පාර,
රාජගිරිය

නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.

ලේකම්
මුදල් අමාත්‍යාංශය
දිනය : 7/10/2020

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්
කොළඹ 01.